**3.0 නාට්‍ය හා රංගකලාවේ සිද්ධාන්ත අනුගමනය කරමින් ප්‍රායෝගික ක්‍රියාකාරකම් හි නියැළෙයි.**

**3.6 ප්‍රකාශනාත්මක නිරූපණයේ යෙදෙමු.**



සතර අභිනය භාවිතා කරමින් වේදිකා නාට්‍ය රඟදක්වා පෙන්වනවා මෙන් ම යම් සිද්ධියක් අවස්ථාවක් හෝ හැඟීමක් සංගීත කණ්ඩයකට අනුව තාලාන්විත චලනයන් මඟින් ප්‍රාසාංගිකව ඉදිරිපත් කිරීමක් සිදු කිරීම ප්‍රකාශනාත්මක නිරූපණයක් ලෙස හඳුන්වාදිය හැකිය.මෙසේ ඉදිරිපත්කිරීම සිදු කරන විට සංගීත කණ්ඩයේ නාදය හා රිද්මය පිළිබඳව අවධානය යොමු කළ යුතුය.අදාළ සංගීත කණ්ඩයෙන් මතුවන හැඟීම පිළිබඳව සැළකිලි මත් වෙමින් එම අදහස හා හැඟීම වඩාත් තීව්‍ර වන පරිදි චලනයන් නිර්මාණය කළ යුතුය.

ආංගික වාචික සාත්වික හා ආහාර්ය අභිනයන් සංගීත ඛණ්ඩයේ හැඟීම ඉස්මතු වන අයුරින් යොදාගත යුතුය.එමෙන්ම මෙම තාලාන්විත හා යම් අදහසක් ඉදිරිපත් කරනු ලබන චලනයන් වේදිකාව සමබරව භාවිතා වන අන්දමින් නිර්මාණය කිරීමට සැළකිලි මත් වීමෙන් නිරූපණයේ සාර්ථකත්වය වඩාත් සාර්ථක කරගත හැකිය.

සංගීත ඛණ්ඩයෙන් මතුවන තේමාවට අදාළව නාට්‍ය රසය මතුවන අන්දමට සිද්ධියක් තාලාන්විත චලනයන් භාවිතා කර ඉදිරිපත් කිරීම මෙම "ප්‍රකාශනාත්මක නිරූපණයේදී "සිදුවෙයි.

ප්‍රකාශනාත්මක නිරූපනයන් යනු කොයි ආකාරයක දැයි අදහසක් ලබා ගැනීමට පහත සබැඳිය වෙත පිවිසෙන්න

පහත සබැඳියෙන් සත්ව හැසිරීම් පිළිබඳව ප්‍රකාශනාත්මක නිරූපණයක් දක්වා ඇත.

https://youtu.be/ZOTO563PEUw